චක්‍ර ලේඛ අංක -4/2011

මගේ අංක :-බ.ප.ස.සේ.කො./ලේ.ඛ/2011
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප)
අංක. 121/3, කිරුළපන මාවත,
කිරුළපන,
කොළඹ 05.
2011.09. 19

සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සමුපකාර ණය ලදන සමිති,
සභාපතිවරුන් වෙත.

බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2010 වැටුප් චක්‍රලේඛය ක්‍රියාත්මක වීමත් සමඟ අනුගමනය කළ යුතු සමුපකාර සේවකයින්ගේ උසස්වීම් පරිපාටිය හා විෂමතා ඉවත් කිරීම.

2 / 2010 වැටුප් චක්‍රලේඛයට අනුව තනතුරු වලට සමුපකාර සේවකයින් අන්තර්ග්‍රහණය කිරීමේ දී ස්ථිර සේවා කාලය හා දරණ ලද වැටුප් පරිමාණ අංක නොසලකා සියලුම සේවකයින් අනුරූපි තනතුරේ III පන්තියට අදාළ වැටුප් පරිමාණයේ පිහිටුවා වැටුප් පරිවර්තනය කර ඇත.

1. ඒ අනුව යම් තනතුරක දිගු සේවා කාලයක් හා කෙටි සේවා කාලයක් ඇති සේවකයින් මෙන්ම එකම තනතුරේ ඉහළ වැටුප් පරිමාණයක හා පහළ වැටුප් පරිමාණයක සේවය කරමින් සිටි සියලුම සේවකයින් නව වැටුප් චක්‍රලේඛය අනුව III වන පන්තියේ පිහිටුවීම නිසා ඇති වී ඇති මෙම විෂමතාව මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කිරීමෙන් ඉවත්වනු ඇත.

2. දැනට සේවයේ නියුක්ත සමුපකාර සේවකයින් ප්‍රථම වතාවට 2 / 2010 චක්‍රලේඛයේ අනුරූපි තනතුරු වල II හා I පන්ති වලට උසස්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය මෙම චක්‍රලේඛය මගින් ද, නව වැටුප් චක්‍රලේඛය අනුව සමස්ත සමුපකාර සේවකයින් සඳහා 2010. 04. 01 වන දින සිට බල පවත්වන උසස්වීම් පරිපාටිය ඉදිරියේදී නිකුත් කරනු ලබන බඳවා ගැනීමේ පරිපාටියේ ද ඇතුළත් කර ඇති අතර, තනතුරු සඳහා වෙනවෙනම බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීමක් සිදු නොකරේ. මෙම චක්‍රලේඛයේ පරිදි සේවයේ නියුක්ත අදාළ සමුපකාර සේවකයින් ප්‍රථම උසස්වීම ලබා ගත් පසු ඊළඟ උසස්වීම් සඳහා නව උසස්වීමේ පරිපාටියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වේ.

3. 2011. 10. 01 දින සිට පැරණි පිරිස්බල තක්සේරු යටතේ සේවකයින් තනතුරු සඳහා පත්කිරීම කොමිෂන් සභාව විසින් අනුමත කරනු නොලැබේ.

2010. 04. 01 දිනට ස්ථිර තනතුරු දරණ ලද 2 / 2010 වැටුප් චක්‍රලේඛයට අනුව වැටුප් පරිවර්තනය කිරීමේ දී තනතුරට අදාළ III පන්තියේ පිහිටුවා ඇති සමුපකාර සේවකයින් පහත දක්වා ඇති ක්‍රියාපරිපාටිය අනුගමනය කර II හා I පන්තිවලට උසස් කළ යුතු වේ. එම ක්‍රියාපරිපාටිය අනුව සුදුසුකම් නොලබන සේවකයින් උසස්වීම් සඳහා සුදුසුකම් ලබන තෙක් III පන්තියේ සේවකයින් ලෙස සැලකිය යුතු ය.

මෙම උසස්වීම් ලබාදීම සඳහා පදනම් කර ගෙන ඇත්තේ සේවකයින් පැරණි පිරිස්බල තක්සේරුව යටතේ අවසානයට අනුමත කර ඇති තනතුරේ වැටුප් පරිමාණ අංක හා සේවා කාලයයි. පහත විධිවිධාන පරිදි සේවකයින් ඒ ඒ පන්තිවලට උසස්වීම් ලබාදීමෙන් අනතුරුව ඉදිරි උසස්වීම් ලබාදීම සඳහා අදාළ කර ගත යුත්තේ නව උසස්වීමේ පරිපාටියේ දැක්වෙන විධිවිධානයන් වේ.

<u>2 / 2010 වැටුප් චක්‍රලේඛනයේ ක්‍රියාත්මක වන දිනය වන විට ස්ථිර සේවයේ නියුක්තව සිටි සමුපකාර සේවකයින් II හා I පන්තියට උසස්කිරීම</u>

මෙම උසස්වීම ලබාදීම සඳහා යම් සමුපකාර සමිතියක අනුමත අවසාන පිරිස්බල තක්සේරුවේ අනුමත වැටුප් පරිමාණ වලට කොමිෂන් සභාවෙන් අනුමත කර ලද සමුපකාර සේවකයින් පමණක් අදාළ කර ගත යුතු ය.

**යම් තනතුරක් සඳහා අනුමත පිරිස්බල තක්සේරුවේ එක් තනතුරකට එක් වැටුප් පරිමාණයක් පමණක් අනුමතව ඇති විට**

I. <u>II පන්තියට උසස්වීම</u>

(A ) පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති දැනටමත් ස්ථිර සේවයේ නියුක්ත සමුපකාර සේවකයින් පැරණි පිරිස්බල තක්සේරුවේ අනුමත වැටුප් පරිමාණයේ තනතුරකට විධිමත් පත්කිරීමක් ඇති අවසාන තනතුරට අනුරූප 2 / 2010 චක්‍රලේඛණයේ අදාළ තනතුරේ II පන්තියට උසස් කරනු ලැබේ.

<u>සුදුසුකම්</u>

1. අවසානයට දරා ඇති තනතුරට අදාළ පැරණි පිරිස්බල තක්සේරුවේ අනුමත වැටුප් පරිමාණයේ තනතුරකට විධිමත් පරිදි පත්වීමක් ලබා තිබීම.
2. 2010. 04. 01 වන දිනට පසුගිය වසර 05ක (පහක) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

(B) ඉහත (I) (A) 2 සුදුසුකම් යටතේ සේවා සපුරා නොතිබේ නම් 2 / 2010 චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අදාළ තනතුරේ III වන පන්තියට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු (I) (A) 1 යටතේ සපුරා ඇති සේවා කාලය ද එකතු කර ඉදිරියේ දී වසර පහක් (5) ක් සම්පූර්ණ වන දිනයේ දී II වන පන්තියට උසස් කරනු ලැබේ.

II. <u>I පන්තියට උසස්වීම</u>

(A ) යම් සේවකයෙකු පැරණි පිරිස්බල තක්සේරුවේ අවසානයට ස්ථිර වී ඇති තනතුරට අදාළ වැටුප් පරිමාණයේ වසර පහළොවක (15) සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නම් 2 / 2010 චක්‍රලේඛයට අනුරූප තනතුරේ I වන පන්තියට උසස් කරනු ලැබේ.

(B) ඉහත (II) (A ) පරිදි අවශ්‍ය සේවා කාලය සපුරා නොතිබේ නම් 2 / 2010 චක්‍රලේඛය පරිදි නව වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු (II) (A) යටතේ සපුරා ඇති සේවා කාලය ද එකතු කර ඉදිරියේ දී වසර 15 සම්පූර්ණ වන දිනයේ දී අවසානයට අනුමත කර ඇති තනතුරේ නව වැටුප් පරිමාණයේ I වන පන්තියට උසස් කළ යුතුය.

**යම් තනතුරක් සඳහා පිරිස්බල තක්සේරුවක වැටුප් පරිමාණ කිහිපයක් අනුමතව ඇති විට**

I. <u>II පන්තියට උසස්වීම</u>

(A) පිරිස්බල තක්සේරුවේ අනුමත කර ඇති තනතුරේ, පහළම වැටුප් පරිමාණයේ වසර 05ක් ද වැටුප් පරිමාණය ක්‍රමයෙන් ඉහළ යන එක් වැටුප් පරිමාණයට එක් වසර බැගින් අඩුකර ලැබෙන වසර ගණන II වන පන්තියට උසස් කිරීම සඳහා සපුරා ගත යුතු අවම සේවා කාලය ලෙස සලකා අවසානයට විධිමත් පත්වීමක් දරණ ලද තනතුරට අනුරූපී වන 2 / 2010 චක්‍රලේඛයේ අදාළ තනතුරේ II වන පන්තියට උසස් කරනු ලැබේ.

උදාහරණ 1

| තනතුරු නාමය | තනතුරු සංකේතය | අනුමත පිරිස්බල තක්සේරුවේ පවතින වැටුප් පරිමාණ අංකය | II පන්තියට උසස් කිරීම සඳහා සපුරා ගත යුතු (ස්ථිර වී ඇති තනතුරේ) සේවා කාලය |
|---|---|---|---|
| ලිපිකරු | 302 | 11 / 12 | 1 |
| | 302 | 13 | 2 |
| | 302 | 14 | 3 |
| | 302 | 15 | 4 |
| | 302 | 16 | 5 |

උදාහරණ 02

| තනතුරු නාමය | තනතුරු සංකේතය | උනුමත පිරිස්බල තක්සේරුවේ පවතින වැටුප් පරිමාණ අංකය | II පන්තියට උසස් කිරීම සඳහා සපුරා ගත යුතු (ස්ථිර වී ඇති තනතුරේ) සේවා කාලය |
| --- | --- | --- | --- |
| වෙළඳසැල් කළමනාකරු | 208 | 13 | 3 |
| | 208 | 14 | 4 |
| | 208 | 15 (අනුමත පහළම වැටුප් පරිමාණය) | 5 |

* එක් එක් සමුපකාර සමිතියට අනුමත පිරිස්බල තක්සේරුව අනුව යම් තනතුරක අනුමත වැටුප් පරිමාණ ගණන විවිධ විය හැක

(I) (B) යම් සේවකයෙකු ඉහත (I) (A) පරිදි අවශ්‍ය සේවා කාලය සපුරා නොමැති නම් එසේ අඩු සේවා කාලය 2 / 2010 වැටුප් චක්‍රලේඛය පරිදි අදාළ තනතුරේ III වන පන්තියට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු ඉහත (I) (A) යටතේ සපුරා ඇති සේවා කාලය ද එකතු කර ඉදිරියේ දී උසස්වීම් සඳහා අවශ්‍ය වසර ගණන සම්පූර්ණ වන දිනයේ දී II වන පන්තියට උසස් කරනු ලැබේ.

II. <u>I පන්තියට උසස්වීම (2 වන උසස්වීම)</u>

(A) අනුමත පිරිස්බල තක්සේරුවේ වැටුප් පරිමාණ කිහිපයක් ඇති තනතුරක පහළම වැටුප් පරිමාණයේ වසර 15ක් ද, වැටුප් පරිමාණය ක්‍රමයෙන් ඉහළ යන විට එක් වැටුප් පරිමාණයට එක් වසර බැගින් අඩුකර ලැබෙන වසර ගණන I වන පන්තියට උසස් කිරීම සඳහා සපුරා ගත යුතු සේවා කාලය ලෙස සලකා එම සේවා කාලය සපුරා ඇති සේවකයින් 2 / 2010 චක්‍රලේඛයේ අනුරූපී තනතුරේ I වන පන්තියට උසස් කරනු ලැබේ.

උදාහරණ 01

| තනතුරු නාමය | තනතුරු සංකේතය | අනුමත පිරිස්බල තක්සේරුවේ පවතින වැටුප් පරිමාණ අංකය | IIපන්තියට උසස් කිරීම සඳහා සපුරා ගත යුතු (ස්ථිර වී ඇති තනතුරේ) සේවා නාමය |
| --- | --- | --- | --- |
| | 302 | | |
| 1. ලිපිකරු | 302 | 11 | 10 |
| | 302 | 12 | 11 |
| | 302 | 13 | 12 |
| | 302 | 14 | 13 |
| | 302 | 15 | 14 |
| | 208 | 16 | 15 |
| 2.වෙළඳසැල් | 208 | 14 | 14 |
| කළමනාකරු | | 15 | 15 |

(B) යම් සේවකයෙකු ඉහත II (A) පරිදි උසස් කිරීම සඳහා අවශ්‍ය සේවා කාලය සපුරා නොමැති නම් එසේ අඩුව පවතින සේවා කාලය 2 / 2010 වැටුප් චක්‍රලේඛය පරිදි අදාළ තනතුරේ III වන පන්තියට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු ඉහත (II) (A) යටතේ සපුරා ඇති සේවා කාලය ද එකතු කර ඉදිරියේ දී උසස්වීම් සඳහා අවශ්‍ය වසර ගණන සම්පූර්ණ වන දිනයේ දී I වන පන්තියට උසස් කරනු ලැබේ.

<u>සැලකිය යුතු විශේෂ කරුණු</u>

I. මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටතේ උසස් කළ හැක්කේ දැනට සමුපකාර සමිතියේ කොමිෂන් සභා අනුමැතිය මත ස්ථිර පත්වීම් ලබා සිටින සේවයේ නියුක්ත ස්ථිර සේවකයින් පමණකි.

II. මෙම චක්‍ර ලේඛයේ විධිවිධාන පරිදි උසස්වීම් ලබා දිය යුත්තේ ප්‍රථම වතාවට පමණි.

III. යම් සේවකයෙකු සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි II පන්තියට හෝ I පන්තියට උසස් කළ යුතු අතර, එසේ උසස්වීම් ලබා දීමේ දී වඩාත්ම පහසුවෙන් සුදුසුකම් ලබන පන්තියට පමණක් පත්කළ යුතුය. සමුපකාර සේවකයින් මෙම චක්‍ර ලේඛයේ පරිදි උසස්වීම් ලබාදීමේ දී 2/2010 චක්‍රලේඛයට අනුව සමු.සං.කො. රෙ. වෙතින් අනුමත කර ගත් නව පිරිස්බල තක්සේරුවල අනුමත සේවකයින් ගණන පමණක් පත්කළ යුතු වේ.

IV. මෙම චක්‍ර ලේඛය යටතේ යම් සේවකයෙකු II පන්තියට හෝ I පන්තියට උසස් කළ පසු ඊළඟ උසස්වීම සඳහා අදාළ කර ගත යුත්තේ ඉදිරියේදී නිකුත් කරනු ලබන විධිවිධානයන් පමණි..

V. මෙම චක්‍ර ලේඛය යටතේ උසස්වීම් ලබාදීමේ දී දැනට සමිතියේ ඒ ඒ තනතුරුවල සේවයේ නියුක්ත සේවකයින්ගේ ජ්‍යෙෂ්ඨත්ව අනුපිළිවෙල වෙනස් නොවිය යුතු අතර, දැනට පවතින ජ්‍යෙෂ්ඨත්ව පිළිවෙළ බිඳී යන පරිදි උසස්වීම් ලබා නොදිය යුතුය. එවැනි අවස්ථා පැන නැගුණහොත් කොමිෂන් සභාවෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කළ යුතුය.

VI. උසස් කිරීම සඳහා කොමිෂන් සභා නිරීක්ෂණය යටතේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ මණ්ඩලයක් මගින් කළ හැකි අතර, ඒ සඳහා කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළ යුතු වේ.

VII. පැරණි පිරිස්බල තක්සේරුව ලෙස අදහස් කරනු ලබන්නේ 2 / 2010 වැටුප් චක්‍රලේඛයේ සඳහන් තනතුරු හා වැටුප් පරිමාණ අංක ඇතුළත් කර නව පිරිස්බල තක්සේරුව අනුමත කර ගන්නා තෙක් සමිතියේ දැනට අනුමත පිරිස්බල තක්සේරුව වේ.

VIII. සතුටුදායක සේවා කාලයක් යන්නෙන් අදහස් කරනු ලබන්නේ පසුගිය වසර පහ තුල වැටුප් වර්ධක උපයාගෙන තිබීමත් සහ විධිමත් විනය පරීක්ෂණයකින් පසු බරපතල දඬුවම් ලබා නොතිබීම යන අවශ්‍යතා සපුරාලන සේවා කාලයයි..

2/2010 චක්‍ර ලේඛයට අනුකූලව නව බඳවා ගැනීමේ පරිපාටි හා උසස් කිරීමේ පරිපාටි නිකුත් කිරීම තරමක් ප්‍රමාද විය හැකි බැවින් අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, යම් සමුපකාර සමිතියක අවසානයට අනුමත කර ඇති පිරිස්බල තක්සේරුවේ තිබූ වැටුප් පරිමාණ අංක වලට අනුරූප කොමිෂන් සභාවෙන් අනුමත පැරණි සුදුසුකම් තවදුරටත් අදාල කර ගැනීමට තාවකාලිකව අනුමත කර ඇති බවත් නව බඳවා ගැනීම් පරිපාටි හා උසස් කිරීමේ පරිපාටි නිකුත් වූ දිනයේ සිට ඉහතින් දෙන ලද තාවකාලික අනුමැතිය අහෝසි වන බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

අයි. ආර්. සෝමසිරි
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත් :-

1. ප්‍රධාන ලේකම් ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප) දැ.පි
2. බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම් - දැ.පි
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප) - දැ.පි.
4. ලේකම්, මධ්‍යම සමුපකාර සේවක කොමිෂන් සභාව - දැ.පි
5. සමපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/කළුතර) - දැ.පි
6. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන් වෙත - දැ.පි
7. සියලුම වෘත්තීය සමිති සංගම් - දැ.පි